අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/ST/BUD/08/01/02/02/01 ඔබේ යොමුව / உமது இல. / Your Ref. දිනය / திகதி / Date 2024.05.06

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පරිවේණාධිපතිවරුන්,
ආයතනාධිපතිනීන් වෙත,

**පිරිවෙන් හා සීලමාතා අධ්‍යාපන ආයතනවල ඉගෙනුම ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා, සීලමාතාවන් හා ගිහි ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ජනාධිපති අරමුදල මගින් පිරිනැමෙන ශිෂ්‍යත්ව වැඩසටහන- 2024/ 2025**

දිවයිනේ සියලුම පිරිවෙන් හා සීලමාතා අධ්‍යාපන ආයතනයක් ම ආවරණය වන පරිදි අධ්‍යාපනික සහ විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා දක්ෂතා දක්වන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා, සීලමාතාවන් හා ගිහි ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ජනාධිපති අරමුදල මගින් ශිෂ්‍යත්ව ලබාදීමේ වැඩසටහනක් ගරු ජනාධිපතිතුමාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක කිරීමට නියමිතය.

මෙම වැඩසටහන, දිවයින පුරා පිහිටි පිරිවෙන් හා සීලමාතා අධ්‍යාපන ආයතන 822 ම (2022 වාර්ෂික සංගණන වාර්තාව - අධ්‍යාපන අමාත්‍යාංශය) ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමට නියමිත අතර, මේ යටතේ එක් පිරිවෙනකට/ සීලමාතා අධ්‍යාපන ආයතනයකට පිරිනැමෙන උපරිම ශිෂ්‍යත්ව සංඛ්‍යාව 06කි. ඒ අනුව පරිවේණාධිපති හිමියන්/ ආයතනාධිපති විසින් තම පිරිවෙනට/ සීලමාතා අධ්‍යාපන ආයතනයට අදාළ ශිෂ්‍යත්වලාභීන් තෝරා ගැනීම සිදු කළ යුතුය. මේ සඳහා සුදුසුකම් ලබන ශිෂ්‍යත්වලාභීන්ට පහත පරිදි ශිෂ්‍යාධාර මුදල් ප්‍රදානය කරනු ලැබේ.

i. කාණ්ඩ අංක 01 - පිරිවෙන් (සාමාන්‍ය පෙළ) දක්වා ඉගෙනුම ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා, සීලමාතාවන් හා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) දක්වා ඉගෙනුම ලබන ගිහි ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් විභාගයට පෙනී සිටින මාසය තෙක් මසකට රු. 3,000.00 බැගින් 2024 මැයි මස සිට මාස 12ක් සඳහා

ii. කාණ්ඩ අංක 02 - පිරිවෙන් (සාමාන්‍ය පෙළ)/ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිට එම විභාගය සමත්ව ප්‍රාචීන විභාග සඳහා පෙනී සිටින හෝ අ.පො.ස. (උසස් පෙළ) සඳහා පෙනී සිටින ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා, සීලමාතාවන් සහ ගිහි ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් වෙනුවෙන් මසකට රු. 6,000.00 බැගින් 2024 මැයි මස සිට ප්‍රාචීන (ප්‍රාරම්භ/මධ්‍යම/අවසාන) විභාගය හෝ අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටින මාසය තෙක් හෝ මාස 24ක උපරිම කාලසීමාවක් සඳහා

**01. ශිෂ්‍යත්ව සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය මූලික සුදුසුකම්**

1.1 පිරිවෙනක හෝ සීලමාතා අධ්‍යාපන ආයතනයක මූලික ශ්‍රේණියේ සිට පිරිවෙන් (සාමාන්‍ය පෙළ) / අ.පො.ස. (සාමාන්‍ය පෙළ)/ ප්‍රාචීන විභාග / අ.පො.ස. (උසස් පෙළ) විභාග සඳහා පෙනී සිටින ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ/ සීලමාතාවක් හෝ ගිහි ශිෂ්‍යයෙකු හෝ ශිෂ්‍යාවක විය යුතුයි.

1.2 ගිහි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පවුලේ මාසික ආදායම රු.100,000/- නොඉක්මවීම.

**02 අයදුම්පත් ඉදිරිපත් කිරීම.**

2.1 මෙම ශිෂ්‍යත්වය ඉල්ලුම් කිරීමේ අයදුම්පත්‍රය **(ඇමුණුම 01)** හා ඊට අදාළ උපදෙස් පත්‍රිකාව **(ඇමුණුම 02)** පිරිවෙනේ / සීලමාතා අධ්‍යාපන ආයතනයේ දැන්වීම් පුවරුවෙහි පළ කිරීමට පරිවේණාධිපතිවරුන් / ආයතනාධිපතිවරුන් විසින් කටයුතු කළ යුතු ය.

2.2 සෑම පිරිවෙනකම/සීලමාතා අධ්‍යාපන ආයතනයකම පරිවේනාධිපති/ ආයතනාධිපති විසින් මෙම ශිෂ්‍යත්ව වැඩසටහන පිළිබඳව තම පිරිවෙනේ/ සීලමාතා අධ්‍යාපන ආයතනයේ ඉගෙනුම ලබන සියලුම ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා/ සීලමාතාවන්/ශිෂ්‍යයන්/ශිෂ්‍යාවන් දැනුම්වත් කළ යුතුය.

2.3 මේ මේ සම්බන්ධව වැඩිදුර තොරතුරු සහ අයදුම්පත්‍රය ජනාධිපති අරමුදලේ www.presidentsfund.gov.lk හා අධ්‍යාපන අමාත්‍යාංශයේ www.moe.gov.lk හා www.piriven.gov.lk/piriven/ යන වෙබ් අඩවිවල සහ ජනාධිපති අරමුදලේ නිල Face Book පිටුව වන www.facebook.com/president.fund හි නියමිත කාලසීමාව තුළ පල කිරීමට කටයුතු කරනු ලැබේ.

2.4 ඉහත අංක 1හි මූලික සුදුසුකම් සපුරා ඇති හා ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට කැමැති ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා / සීලමාතාවන් හා ගිහි ශිෂ්‍ය ශිෂ්‍යාවන් අදාළ අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතිය **(ඇමුණුම 01)** අනුව අයදුම්පත්‍රයක් සකස් කරගත යුතුය. එසේ සකස් කර ගත් අයදුම්පත්‍රය සම්පූර්ණ කර අදාළ සහතිකවල පිටපත් සහිතව <u>තම පිරිවෙනේ / සීලමාතා අධ්‍යාපන ආයතනයේ පරිවේණාධිපති / ආයතනාධිපති වෙත පමණක් නියමිත දිනට හෝ ඊට පෙර හෝ අතින් භාරදීමට කටයුතු කළ යුතුය.</u>

2.5 ගිහි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පවුලේ මාසික ආදායම පිළිබඳව ග්‍රාම නිලධාරි විසින් සහතික කර ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය ද සහිතව ඉදිරිපත් කළ යුතුය. (ආදායම් වාර්තා ලබා ගැනීම අවශ්‍ය නැත.)

2.6 නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, අදාළ අයදුම්පතෙහි සඳහන් සුදුසුකම් සනාථ කිරීමට අවශ්‍ය සහතිකවල පිටපත් නොමැති සහ අඩුපාඩු සහිත අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

## 03. තෝරා ගැනීමේ ක්‍රමවේදය (සියලු ශ්‍රේණි සඳහා)

### 3.1 පිරිවෙන් / සීලමාතා අධ්‍යාපන ආයතන මට්ටම

3.1.1 **මෙම චක්‍රලේඛයේ අංක 4 යටතේ දැක්වෙන නිර්ණායක හා ලකුණු පටිපාටිය මත පදනම්ව පිරිවෙන් / සීලමාතා අධ්‍යාපන ආයතන තේරීම් කමිටුවක් මඟින් ලැබී ඇති අයදුම්පත්වල ලකුණු පරීක්ෂා කළ යුතු ය. පිරිවෙන් / සීලමාතා අධ්‍යාපන ආයතන තේරීම් කමිටුව,පරිවේණාධිපති / ආයතනාධිපති හෝ පරිවේණාධිපති / ආයතනාධිපති විසින් බලය පවරන ලද නියෝජ්‍ය පරිවේණාධිපති / නියෝජ්‍ය ආයතනාධිපතිගේ හෝ සභාපතිත්වයෙන් යුතුව ජ්‍යෙෂ්ඨ පරිවේණාචාර්යවරුන් දෙදෙනෙකුගෙන් සමන්විත වන පරිදි සකස් විය යුතු ය.**

3.1.2 **ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා / සීලමාතාවන් / ශිෂ්‍යයන් / ශිෂ්‍යාවන් විසින් නියමිත දින හෝ ඊට පෙර හෝ ලබාදෙනු ලබන අයදුම්පත්, පිරිවෙන් / සීලමාතා අධ්‍යාපන ආයතන තේරීම් කමිටුවට යොමු කර අදාළ ලකුණු පරීක්ෂා කර සහතික කළ යුතු ය. පසුව එක් එක් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා / සීලමාතාවන් / ශිෂ්‍යයන් / ශිෂ්‍යාවන් ලබා ඇති ලකුණු මත මෙම ශිෂ්‍යත්වය ලබාදිය යුතු ඉතා ම සුදුසු ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා / සීලමාතාවන් / ශිෂ්‍යයන් / ශිෂ්‍යාවන් තෝරා, <u>ශිෂ්‍යත්වය සඳහා සුදුසුකම් ලබන අනුපිළිවෙළ මත ඇමුණුම 03හි සඳහන් ආකාරයට තම පිරිවෙනට / සීලමාතා අධ්‍යාපන ආයතනයට අදාළ උපරිම ශිෂ්‍යත්ව සංඛ්‍යාවට සරිලන නාම ලේඛනය, ඉදිරිපත් කර ඇති අයදුම්පත ද සමඟින් ප්‍රමුඛතාගත කර පිරිවෙන් / සීලමාතා අධ්‍යාපන ආයතනඅයත් වන අධ්‍යාපන කලාපයේ කලාප භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) හිමි වෙත නියමිත දින හෝ ඊට පෙර හෝ යොමු කළ යුතු ය.</u>**

3.1.3 **ශිෂ්‍යත්වලාභීන් පිරිවෙන් / සීලමාතා අධ්‍යාපන ආයතන මට්ටමින් තෝරාගැනීමේ දී ආර්ථික අපහසුතා හෝ වෙනත් යම්කිසි හේතුවක් මත හෝ යම් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ නමකට/ සීලමාතාවකට / ශිෂ්‍යයෙකුට / ශිෂ්‍යාවකට මෙම ශිෂ්‍යත්වය ලබාදීම ඉතාම සුදුසු බවට පිරිවෙන් / සීලමාතා අධ්‍යාපන ආයතන තේරීම් කමිටුව සෑහීමකට පත්වන්නේ නම්, එවැනි අවස්ථාවක මෙම ලකුණු මට්ටම් නොසලකා අදාළ කමිටුවේ අභිමතය පරිදි ශිෂ්‍යත්වය සඳහා තෝරා ගැනීමට කටයුතු කළ හැකි අතර, එම තෝරාගැනීම පිළිබඳ ව කලාප භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) ගේ නිර්දේශය ලබාගත යුතු ය. කෙසේ වුවද මෙලෙස සුවිශේෂී ව ලබා දෙනු ලබන ශිෂ්‍යත්ව සංඛ්‍යාව එක් පිරිවෙනකට / සීලමාතා අධ්‍යාපන ආයතනකට උපරිම වශයෙන් එක් ශිෂ්‍යත්වයකට සීමා විය යුතුය.**

3.1.4 පිරිවෙන්/ සීලමාතා අධ්‍යාපන ආයතන මට්ටමින් තෝරගත් අයදුම්කරුවන්ට එම අයදුම්කරු සහ මව/පියා/භාරකරුගේ හවුල්කාරීත්වයෙන් යුතුව පවතින, මාසිකව ශිෂ්‍යාධාර ලබාගත හැකි ආකාරයේ විශේෂ බද්ධ ගිණුමක් විවෘත කර එම ඉතිරි කිරීමේ ගිණුමේ විස්තර ඇතුළත් පිටුවේ (තොරතුරු පිටුව) ඡායා පිටපතක් සහ මව/පියා/භාරකරුගේ ජාතික හැඳුනුම්පතෙහි පරිවේණාධිපති / ආයතනාධිපති විසින් සහතික කරන ලද ඡායා පිටපතක් කලාප භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) වෙත ඉදිරිපත් කළ යුතු ය.

3.1.5 ඉදිරිපත් කර ඇති අනෙකුත් සියලුම අයදුම්පත් පිරිවෙනේ / සීලමාතා අධ්‍යාපන ආයතනයේ සුරැකිව තබා ගැනීමට කටයුතු කළ යුතු ය.

## 3.2 කලාප මට්ටම

3.2.1 මෙම ශිෂ්‍යත්ව වැඩසටහන සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකු පත්කිරීමට කලාප භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ(පිරිවෙන්) විසින් කටයුතු කළ යුතු ය.

3.2.2 i. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමට නිර්දේශ කරනු ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා / සීලමාතාවන්ගේ/ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ගේ තොරතුරු, ලබාගත් ලකුණු අනුපිළිවෙල මත ඇමුණුම 04හි සඳහන් ආකෘතියේ දක්වා ඇති පරිදි කලාපයේ ඇති සියලුම පිරිවෙන් / සීලමාතා අධ්‍යාපන ආයතන සඳහා එක් ශිෂ්‍ය නාම ලේඛනයක් සකස් කළ යුතු ය.

ii. ඊට සමගාමීව තෝරාගත් ශිෂ්‍යත්වලාභීන්ගේ බැංකු ගිණුම් තොරතුරු සහිත ලේඛනය ද (ඇමුණුම 05හි සඳහන් ආකෘතිය අනුව) සකස් කිරීම කළ යුතු ය. අයදුම්කරු සහ මව/පියා/භාරකරුගේ හවුල්කාරීත්වයෙන් යුතුව පවතින, මාසිකව ශිෂ්‍යාධාර ලබාගත හැකි ආකාරයේ (විශේෂ බද්ධ ගිණුමක්) ඉතිරිකිරීමේ ගිණුමක් විවෘත කර එම ගිණුමේ විස්තර ඇතුළත් පිටුවේ (තොරතුරු පිටුව) පැහැදිලි ඡායා පිටපතක් සහ මව/පියා/භාරකරුගේ ජාතික හැඳුනුම්පතෙහි පරිවේණාධිපති / ආයතනාධිපති විසින් සහතික කරන ලද ඡායාපිටපතක් ද ලබා ගෙන ඇමුණුම 05හි සඳහන් ආකෘතිය සමඟ ඉදිරිපත් කළ යුතු ය.

සැ.යු. :-

- අදාළ සෑම ආකෘතියක ම ශිෂ්‍යත්වලාභීන්ගේ නාම ලේඛන අනුපිළිවෙළ නොවෙනස්ව සඳහන් කිරීමට කටයුතු කළ යුතු අතර, ජාතික හැඳුනුම්පතේ/ බැංකු ගිණුම්වල සඳහන් නම් අයදුම්පතේ සඳහන් කර ඇති නම් හා සමාන විය යුතු ය.
- ශිෂ්‍යත්වලාභියා, පැවිදි කළ ආචාර්යවරයා/ආචාර්ය සීලමාතාවන් වහන්සේ මව/පියා නොමැතිව භාරකරුවෙකු ලඟ සිටී නම් තහවුරු කිරීමේ ලේඛනයක් ලබාගත යුතු ය.

3.2.5 තෝරාගත් ශිෂ්‍යත්වලාභීන්ගේ ලේඛන කලාප භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) විසින් සහතික කර මෘදු හා දෘඪ පිටපත් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)ටද පිටපත් සහිතව අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (පිරිවෙන්) වෙත යොමු කළ යුතු ය. (මේ සමග තේරීපත්වූ අයදුම්කරු සහ මව/පියා/භාරකරුගේ හවුල්කාරීත්වයෙන් යුතුව පවතින, මාසිකව ශිෂ්‍යාධාර ලබාගත හැකි ආකාරයේ (විශේෂ බද්ධ ගිණුමක්) ඉතිරිකිරීමේ ගිණුමේ විස්තර ඇතුළත් පිටුවේ (තොරතුරු පිටුව) පැහැදිලි ඡායා පිටපතක් සහ මව/පියා/භාරකරුගේ ජාතික හැඳුනුම්පතෙහි පරිවේණාධිපති / ආයතනාධිපති විසින් සහතික කරන ලද ඡායා පිටපතක් ද යොමු කළ යුතු ය.)

3.2.6 චක්‍රලේඛයේ 3.2.1 හි සඳහන් කලාප සම්බන්ධීකරණ නිලධාරීන් විසින් පිරිවෙන් / සීලමාතා අධ්‍යාපන ආයතන මඟින් යොමු කර ඇති අයදුම්පත් සහ නාම ලේඛන ගොනු කර තබා ගත යුතුය.

## 3.3 පළාත් මට්ටම

3.3.1 මෙම ශිෂ්‍යත්ව වැඩසටහන සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකු පත්කිරීමට පළාත් භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ(පිරිවෙන්) විසින් කටයුතු කළ යුතු ය.

3.4 ජාතික මට්ටම

3.4.1 **කලාප භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ** (අධ්‍යක්ෂ) නිර්දේශ කර අධ්‍යක්ෂ (පිරිවෙන්) මගින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරනු ලබන තෝරාගත් ශිෂ්‍ය නාම ලේඛනය **ඇමුණුම 04හි සඳහන් ආකෘතිය** හා බැංකු ගිණුම් විස්තර ඇතුළත් ලේඛන **ඇමුණුම 05හි සඳහන් ආකෘතිය** නියමිත කාල සීමාවේ දී අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ ද නිර්දේශ සහිතව ලේකම්, ජනාධිපති අරමුදල වෙත යොමු කරනු ඇත.

3.4.2 එලෙස යොමු කරනු ලබන යෝජිත ශිෂ්‍යත්වලාභීන් සඳහා පමණක් මෙම ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලැබේ.

**04. නිර්ණායක හා ලකුණු පටිපාටිය**

**අයදුම්කරුවෙකුට ලබාදිය හැකි උපරිම ලකුණු සංඛ්‍යාව ලකුණු 100 කි.**

**4.1 ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ/සීලමාතාවන් සහ ගිහි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ කාර්යසාධනය**

**4.1.1** කාණ්ඩ අංක 01 - පිරිවෙන් (සාමාන්‍ය පෙළ)/ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) දක්වා ඉගෙනුම ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා, සීලමාතාවන් හා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) දක්වා ඉගෙනුම ලබන ගිහි ශිෂ්‍ය ශිෂ්‍යාවන් 2023 වර්ෂයේ පැවති අවසාන වාර පරීක්ෂණයේ දී පන්තියේ ලබා ඇති ස්ථානය

| | |
|---|---|
| 01 වන ස්ථානය සිට 03 වන ස්ථානය දක්වා | ලකුණු 70 |
| 04 වන ස්ථානය සිට 06 වන ස්ථානය දක්වා | ලකුණු 65 |
| 07 වන ස්ථානය සිට 10 වන ස්ථානය දක්වා | ලකුණු 60 |
| 11 වන ස්ථානය සිට 15 වන ස්ථානය දක්වා | ලකුණු 55 |
| 16 වන ස්ථානය සිට 20 වන ස්ථානය දක්වා | ලකුණු 50 |

(උපරිම ලකුණු 70)

**4.1.2** කාණ්ඩ අංක 02 සහ 03 - පිරිවෙන් (සාමාන්‍ය පෙළ) /අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිට එම විභාගය සමත්ව ප්‍රාචීන විභාගය සඳහා පෙනී සිටින හෝ අ.පො.ස. (උසස් පෙළ) සඳහා පෙනී සිටින ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා, සීලමාතාවන් සහ ගිහි ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් පිරිවෙන් (සාමාන්‍ය පෙළ) /අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ලබාගත් ප්‍රතිඵල

| | |
|---|---|
| විශිෂ්ට සාමාර්ථයක් සඳහා (A) | ලකුණු 08 |
| අධි සම්මාන සාමාර්ථයක් සඳහා (B) | ලකුණු 06 |
| සම්මාන සාමාර්ථයක් සඳහා (C) | ලකුණු 04 |
| සාමාන්‍ය සාමාර්ථයක් සඳහා (S) | ලකුණු 02 |

(උපරිම ලකුණු 70)

**4.2 විෂය සමගාමී ක්‍රියාකාරකම් (ක්‍රීඩා/ සෞන්දර්ය සහ වෙනත් (අයදුම්පතේ අංක 03)**

පිරිවෙන්/සීලමාතා අධ්‍යාපන ආයතන මට්ටමින් ක්‍රියාත්මක අන්තර් පාරිවේණික භාෂා හා සාහිත්‍ය තරග/ මලලක්‍රීඩා/ වෙස්/ පිහිනුම්/ ජිම්නාස්ටික්/ කරාතේ/ පරිසර ළමා සමාජ/ වාදනය/ගායනය/චිත්‍ර/නැටුම්/ පෝතක බාලදක්ෂ/ කුඩා මිතුරි සහ වෙනත් අනුමත විෂය සමගාමී ක්‍රියාකාරකම් (ගිහි හෝ පැවිදි සඳහා අදාළ වන පරිදි)

| | පිරිවෙන්/ සීලමාතා අධ්‍යන ආයතන මට්ටම | කලාප මට්ටම | දිස්ත්‍රික්/පළාත් මට්ටම | ජාතික මට්ටම |
|---|---|---|---|---|
| පළමුවන ස්ථානය | 07 | 08 | 09 | 10 |
| දෙවන ස්ථානය | 05 | 06 | 07 | 08 |
| තුන්වන ස්ථානය | 03 | 04 | 05 | 06 |

(උපරිම ලකුණු 10)

සැ.යු. :-

- එක් අවුරුද්දකට පමණක් ලකුණු ලබාදීමට යටත් ව, ආසන්න පසුගිය වසර 03ක් සලකා බැලීම සුදුසු ය.
- එක් ශිෂ්‍යත්වලාභියකුට එක ම විෂය සමගාමී ක්‍රියාකාරකමක් සඳහා ජාතික, පළාත්, කලාප සහ පිරිවෙන්/ සීලමාතා අධ්‍යන ආයතන /පාසල් යන මට්ටම් තුනේ ම අනුයාත වසර 03කට අදාළව ජයග්‍රහණ පවතී නම් ලකුණු දීමේදී සැලකිල්ලට ගත යුත්තේ ඉහළ ම ලකුණු මට්ටම පමණි.

**4.3** <u>ශිෂ්‍ය නායකත්වය (අයදුම්පතේ අංක 03) - සියලු ශ්‍රේණි සඳහා</u> (දැනට දරන හෝ දරා ඇති)

| | |
|---|---|
| පිරිවෙන්/සීලමාතා අධ්‍යාපන ආයතන ප්‍රධාන ශිෂ්‍ය නායක / උප ප්‍රධාන ශිෂ්‍ය නායක | ලකුණු 15 |
| ශිෂ්‍ය නායක (ජ්‍යෙෂ්ඨ/කනිෂ්ඨ ) | ලකුණු 12 |
| පන්ති නායක | ලකුණු 10 |

(උපරිම ලකුණු 15)

සැ.යු. :- **ඉහත 4.3හිදි ලකුණු දීමේදී සැලකිල්ලට ගත යුත්තේ ඉහළම ලකුණු මට්ටම පමණි.**

**4.4** <u>අයදුම්කරු දහම් පාසල් අධ්‍යාපනය හැදෑරීම (අයදුම්පතේ අංක 04) සියලු ශ්‍රේණි සඳහා</u>
<u>(දහම් පාසල් ප්‍රධානාචාර්ය විසින් නිකුත් කළ සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.)</u>

| | |
|---|---|
| දහම් පාසල් අධ්‍යාපනය හැදෑරීම<br>(වසරකට වැඩි කාලයක් දහම් අධ්‍යාපනය ලැබීම සහ මේ වන විටත් දහම් පාසලක ශිෂ්‍යයකු/ ශිෂ්‍යාවක ලෙස කටයුතු කිරීම.) | ලකුණු 05 |

(උපරිම ලකුණු (05)

- සියලු ලියාපදිංචි ආගමික දහම් පාසල් මේ යටතට අයත් වේ.

**05 ශිෂ්‍යත්ව ප්‍රදානය**

5.1 මෙම ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ 2024 මැයි මස සිට මාසිකව ශිෂ්‍යත්වලාභීන්ට පහත පරිදි ශිෂ්‍යාධාර මුදල් ප්‍රදානය කරනු ලැබේ.

i. කාණ්ඩ අංක 01 - පිරිවෙන් (සාමාන්‍ය පෙළ) දක්වා ඉගෙනුම ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා, සීලමාතාවන් හා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) දක්වා ඉගෙනුම ලබන ගිහි ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් මසකට රු. 3,000.00 බැගින් 2024 මැයි මස සිට මාස 12ක් සඳහා

ii. කාණ්ඩ අංක 02 - පිරිවෙන් (සාමාන්‍ය පෙළ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිට එම විභාගය සමත්ව ප්‍රාචීන විභාගය සඳහා පෙනී සිටින හෝ අ.පො.ස. (උසස් පෙළ) සඳහා පෙනී සිටින ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා, සීලමාතාවන් සහ ගිහි ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් මසකට රු. 6,000.00 බැගින් 2024 මැයි මස සිට ප්‍රාචීන (ප්‍රාරම්භ/මධ්‍යම/අවසාන) විභාගය හෝ අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටින මාසය තෙක් හෝ මාස 24ක උපරිම කාලසීමාවක් සඳහා ශිෂ්‍යත්වලාභීන් තෝරා ගත් පසුව අදාළ මුදල ලබාදී ඇති ශිෂ්‍යත්වලාභියාගේ සහ මව/පියා/භාරකරුගේ හවුල්කාරීත්වයෙන් යුතුව පවතින මාසිකව ශිෂ්‍යාධාර ලබා ගත හැකි ආකාරයේ (විශේෂ බද්ධ ගිණුමක) සක්‍රිය බැංකු ගිණුමකට පමණක් සෘජුව ම මුදල් බැර කරනු ලැබේ.

5.2 යම් ශිෂ්‍යත්වලාභියකු කිසියම් හේතුවක් නිසා දැනට ඉගෙනුම ලබන පිරිවෙනෙන් / සීලමාතා අධ්‍යාපන ආයතනයෙන් විධිමත් ලෙස ඉවත් ව වෙනත් පිරිවෙනකට / සීලමාතා අධ්‍යාපන ආයතනකට ඇතුළත් වූයේ නම්, ඒ බව තහවුරු කරන ලිපියක් නව පිරිවෙනේ / සීලමාතා අධ්‍යාපන ආයතනයේ/පරිවේණාධිපති / ආයතනාධිපති මඟින් (ඇමුණුම 06 හි ආකෘතිය අනුව) ජනාධිපති අරමුදල වෙත දන්වා එවිය යුතු ය.

## 06 ශිෂ්‍යත්ව නියාමනය

6.1 ශිෂ්‍යත්ව නියාමනය කලාප මට්ටමින් සිදු කිරීම අදාළ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා / සීලාමාතාවන් ඉගෙනුම ලබන පිරිවෙන / සීලමාතා අධ්‍යාපන ආයතනය අයත් කලාප භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) විසින් සිදු කළ යුතුය. ඒ සඳහා පත් කළ සම්බන්ධී කරණ නිලධාරියාට අදාළ වගකීම පැවරිය යුතු ය.

6.2 පළාත් මට්ටමින් ශිෂ්‍යත්වලාභීන් සම්බන්ධීකරණය කිරීම අදාළ පළාත් භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) විසින් සිදු කළ යුතු අතර, ඒ සම්බන්ධ වගකීම අදාළ සම්බන්ධීකරණ නිලධාරියාට පැවරිය යුතු ය.

6.3 ජාතික මට්ටමින් ශිෂ්‍යත්වලාභීන් නියාමනය කිරීම අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන අංශය සහ ජනාධිපති අරමුදල මඟින් සිදු කරනු ඇත.

## 07 ශිෂ්‍යත්ව අවලංගු කිරීම

පහත සඳහන් හේතු මත මෙම ශිෂ්‍යත්වලාභීන් වෙත ලබාදෙන ශිෂ්‍යත්ව අවලංගු කිරීමේ බලය ජනාධිපති අරමුදල සතු ය.

I. ශිෂ්‍යත්වලාභියා විනය විරෝධී හැසිරීමක් සඳහා දඬුවම් ලැබීම.

II. පිළිගත හැකි හේතුවක් නොදන්වා දින 21ක් අඛණ්ඩ ව පිරිවෙනට / සීලමාතා අධ්‍යාපන ආයතනට නොපැමිණීම.

III. පිරිවෙන් / සීලමාතා අධ්‍යාපන ආයතන අධ්‍යාපන කටයුතුවලින් බැහැර වීම. (පිරිවෙන / සීලමාතා අධ්‍යාපන ආයතනය හැරයාමේ සහතිකය නිකුත් කිරීම.)

IV. ගාස්තු ගෙවනු ලබන ජාත්‍යන්තර පාසලකට ඇතුළත් වීම.

**සැ.යු. - ඉහත කොන්දේසි කඩ වී ඇති විටෙක ශිෂ්‍යත්වය අවලංගු කිරීම සඳහා පිරිවෙනාධිපති/ ආයතනාධිපති විසින් කලාප භාර සහකාර අධ්‍යක්ෂ මඟින් ජනාධිපති අරමුදල වෙත දැන්විය යුතුය.**

## 08 ශිෂ්‍යත්ව සම්බන්ධ තොරතුර දැන ගැනීම

මෙම උපදෙස් ලිපියේ සඳහන් යම් කරුණක් පිළිබඳ පැහැදිලි කර ගැනීමට අවශ්‍ය වන්නේ නම්, පහත සඳහන් විද්‍යුත් තැපැල වෙත (Email) පණිවිඩයක් එවීම හෝ දුරකථන අංකය වෙත අමතා හෝ අවශ්‍ය තොරතුරු ලබා ගත හැකි ය.

විද්‍යුත් තැපැල (Email) :- pfschol@presidentsoffice.lk
දුරකථන අංකය :- 011- 2 354 354 (දිගුව - 4830/ 4835/ 4837)
WhatsApp අංකය :- 074 -085 4527 (පණිවුඩ පමණි.)

- **අයදුම්පත්‍ර සම්පූර්ණ කිරීමේ යම් ගැටලුවක් පැන නගින්නේ නම් අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශය මඟින් විමසිය හැකිය.**

දුරකථන අංකය :- 011- 2 784461

**09** කාල රාමුව

| | කාර්යය | කාලය (අදාළ කාර්යය නිම කළ යුතු අවසන් දිනය) |
|---|---|---|
| 9.1 | අයදුම්පත් කැඳවීම | 2024.05.06 |
| 9.2 | සම්පූර්ණ කරන ලද අයදුම්පත් පරිවේණාධිපති / ආයතනාධිපති වෙත භාර දීම. | 2024.05.22 |
| 9.3 | පිරිවෙන් / සීලමාතා අධ්‍යාපන ආයතන මට්ටමින් සුදුසුකම්ලාභීන් තෝරාගැනීමේ කටයුතු සිදු කර පරිවේණාධිපති / ආයතනාධිපති විසින් පාසල් මට්ටමින් තෝරාගත් ශිෂ්‍ය නාම ලේඛන කලාප අධ්‍යාපන කාර්යාලයට යොමු කිරීම. | 2024.05.27 |
| 9.4 | කලාප මට්ටමින් සුදුසුකම්ලාභී ලේඛන සකස් කර පළාත් නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවද (පිරිවෙන්) පිටපත් සහිතව අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන අංශය වෙත යොමු කිරීම. | 2024.05.29 |
| 9.4 | අධ්‍යාපන අමාත්‍යාංශය මගින් එම ලේඛන ජනාධිපති අරමුදල වෙත යොමු කිරීම. | 2024.05.30 |

දැනට ක්‍රියාත්මක වන වෙනත් ඕනෑම ශිෂ්‍යාධාර වැඩසටහනක් යටතේ ශිෂ්‍යාධාර හෝ ශිෂ්‍යත්ව හෝ හිමි වුවද මේ සඳහා මූලික සුදුසුකම් සපුරන්නේ නම් මෙම වැඩසටහන සඳහා ද අයදුම් කළ හැකි ය.

මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් කිසියම් ගැටලුවක් මතු වන්නේ නම් ඒ පිළිබඳව ජනාධිපති ලේකම් විමසා අවසන් තීරණය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් ගනු ඇත.

..............................

ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :-

01. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය - කාරුණික දැන ගැනීම සඳහා
02. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම සඳහා
03. ලේකම්, ජනාධිපති අරමුදල - කාරුණික දැන ගැනීම සඳහා

ඇමුණුම 02

<u>උපදෙස් පත්‍රිකාව</u>

**<u>අධ්‍යාපන කටයුතු සඳහා පිරිවෙන් හා සීලමාතා අධ්‍යාපන ආයතනවල 02 ශ්‍රේණියේ සිට පිරිවෙන් 13 ශ්‍රේණිය/ප්‍රාචීන පණ්ඩිත විභාගය දක්වා ඉගෙනුම ලබන ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා /සීලමාතාවන්/ශිෂ්‍ය/ශිෂ්‍යාවන් වෙනුවෙන් ජනාධිපති අරමුදල මගින් පිරිනැමෙන ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන - 2024/2025</u>**

**සුදුසුකම්**

- පිරිවෙන් 02 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය /ප්‍රාචීන පණ්ඩිත විභාගය දක්වා ඉගෙනුම ලබන ශ්‍රේණිවල 2023 වසරේ පැවති අවසාන වාර පරීක්ෂණය අනුව 01-20 දක්වා ස්ථානයක් ලබා ගැනීම.

  සැ.යු. :- 2024 වර්ෂයේ 1 ශ්‍රේණියට ඇතුළත් වූ ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා / සීලමාතාවන් / ශිෂ්‍ය /ශිෂ්‍යාවන්ට සහ 2024 වර්ෂයේ පැවැත්වූ 2023 අ.පො.ස (සා.පෙළ) විභාගයට සහ 2023 ප්‍රාචීන ප්‍රාරම්භ විභාගයට පෙනී සිටි ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ/සීලමාතා/ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ට මෙ සඳහා අයදුම්කළ නොහැකි ය.
- රජයේ අනුමත පිරිවෙනක හා සීලමාතා අධ්‍යාපන ආයතනයක ඉගෙනුම ලබන ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ/සීලමාතා/ශිෂ්‍ය/ශිෂ්‍යාවක වීම.
- ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ පවුලේ මාසික ආදායම රු.100,000/- නොඉක්මවීම.

**<u>අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම සහ භාර දීම.</u>**

- අයදුම්පත්‍රයේ I කොටස සහ II කොටසේ අංක 1 සිට 4 දක්වා කොටස් ශිෂ්‍යයා/ශිෂ්‍යාව විසින් සම්පූර්ණ කළ යුතු අතර ලකුණු ලබා දීම ද ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ/සීලමාතාව/ශිෂ්‍ය/ශිෂ්‍යාව විසින් ම සිදු කළ යුතු ය. අදාළ ලකුණු පිරිවෙන් /සීලමාතා අධ්‍යාපන ආයතනයේ තේරීම් කමිටුව විසින් පරීක්ෂා කර සහතික කළ යුතු ය.
- සෑම විට ම නිවැරදි තොරතුරු ඇතුළත් කළ යුතු ය.
- WhatsApp පණිවුඩ යැවීමට හැකි දුරකථන අංකයක් සඳහන් කළ යුතු ය. ඔබ වෙත එවැනි දුරකථන අංකයක් නොමැතිනම්, පවුලේ ළඟ ම ඥාතියකුගේ / පරිවේණාචාර්යවරයෙකුගේ / පරිවේණාධිපති හිමිගේ / ආයතනාධිපති හිමිගේ දුරකථන අංකයක් ඔවුන්ගේ එකඟතාවයක් සහිතව ලබා දීමට කටයුතු කළ යුතු ය.

ගිහි සිසු/සිසුවියන් පවුලේ ආදායම් තත්ත්වය පිළිබඳ ව තමන් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගේ සහතිකය ද ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශයද (ආදායම් වාර්තාවක් ලබා ගැනීම අවශ්‍ය නොවේ) සමඟින් **සම්පූර්ණ කරන ලද අයදුම්පත තම පිරිවෙනේ / සීලමාතා අධ්‍යාපන ආයතනයේ පරිවේනාධිපති / ආයතනාධිපති වෙත පමණක් භාර දිය යුතු ය.**

| |
|---|
| පරිවේණාධිපති/ආයතනාධිපති විසින් තම පිරිවෙනට උපරිම ශිෂ්‍යත්වලාභීන් ගණන තෝරාගත් බව දැනුම් දුන් පසු එම ශිෂ්‍යත්ව ලාභියාගේ මව/පියා/භාරකරුගේ හවුල්කාරීත්වයෙන් යුතුව පවතින මාසිකව ශිෂ්‍යාධාර ලබාගත හැකි (විශේෂ බද්ධ ගිණුමක්) සක්‍රීය ගිණුමක් මහජන බැංකුවේ, ලංකා බැංකුවේ හෝ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ශාඛාවකින් විවෘත කර, එම ගිණුමේ තොරතුරු සඳහන් පිටුවේ සහ මව/පියා/ භාරකරුගේ ජාතික හැඳුනුම්පතහි පැහැදිලි ඡායාපිටපතක් පරිවේණාධිපති /ආයතනාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එම ඡායාපිටපත් පරිවේණාධිපති/ආයතනාධිපති විසින් සහතික කළ යුතු ය.<br><br>සැ.යු. කෙසේ වුවද පරිවේණාධිපති /ආයතනාධිපති විසින් ශිෂ්‍යත්ව ලාභියකු ලෙස තෝරාගත් බව දන්වන තෙක් බද්ධ ගිණුමක් විවෘත කිරීමට අවශ්‍ය නැත. |

- කිසිදු අවස්ථාවක අයදුම්පත් ජනාධිපති කාර්යාලයට හෝ ජනාධිපති අරමුදල වෙත ගෙනවිත් භාර දීම හෝ තැපැල මගින් යොමු නොකළ යුතු ය.

## 1. ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ / සීලමාතාව / ශිෂ්‍ය / ශිෂ්‍යාවන්ගේ කාර්ය සාධනය

1.1. ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ/ සීලමාතාව/ ශිෂ්‍යයා/ ශිෂ්‍යාව 2023 (2024) වර්ෂයේ පැවති අවසාන වාර පරීක්ෂණයේ දී ලබා ගෙන ඇති ස්ථානය.

සැ.යු. :-

- පිරිවෙන්/සීලමාතා අධ්‍යාපන ආයතන තුළ 02 ශ්‍රේණියේ සිට 04 ශ්‍රේණිය දක්වා, 06 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණිය දක්වා සහ උසස් පෙළ සහ ප්‍රාචීන අවසාන විභාගය දක්වා ඉගෙනුම ලබන ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ/ සීලමාතාවන් / ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් විය යුතු ය.

| | |
|---|---|
| 01 වන ස්ථානය සිට 03 වන ස්ථානය දක්වා | ලකුණු 70 |
| 04 වන ස්ථානය සිට 06 වන ස්ථානය දක්වා | ලකුණු 65 |
| 07 වන ස්ථානය සිට 10 වන ස්ථානය දක්වා | ලකුණු 60 |
| 11 වන ස්ථානය සිට 15 වන ස්ථානය දක්වා | ලකුණු 55 |
| 16 වන ස්ථානය සිට 20 වන ස්ථානය දක්වා | ලකුණු 50 |
| (උපරිම ලකුණු 70) | |

1.2. 02 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා සහ ප්‍රාචීන ප්‍රාරම්භ පංතියේ සිට ප්‍රාචීන අවසාන පංතිය දක්වා පංතිවල ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා/ සීලමාතාවන් හා ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා පමණි.

| | | |
|---|---|---|
| විශිෂ්ට සාමාර්ථයක් සඳහා | (A) | ලකුණු 08 |
| අධි සම්මාන සාමාර්ථයක් සඳහා | (B) | ලකුණු 06 |
| සම්මාන සාමාර්ථයක් සඳහා | (C) | ලකුණු 05 |
| සාමාන්‍ය සාමාර්ථයක් සඳහා | (S) | ලකුණු 04 |

1.1. විෂය සමගාමී ක්‍රියාකාරකම්

**පිරිවෙන් මට්ටමින් ක්‍රියාත්මක අන්තර් පාරිවේණික භාෂා හා සාහිත්‍ය (අන්තර් පාරිවේණික සිසු නිපුණතා ඇගයීම) තරඟ/ ක්‍රීඩා ජයග්‍රහණ (කේවල / සමූහ) විෂය සමගාමී (සමිති, සමාගම් යනාදිය ඇතුළත් ව) ආදිය සහ වෙනත් අනුමත විෂය සමගාමී ක්‍රියාකාරකම් වලට අදාළ ජයග්‍රහණ**

| | පිරිවෙන්/ සීලමාතා අධ්‍යාපන ආයතන මට්ටම | කලාප මට්ටම | පළාත් මට්ටම | ජාතික මට්ටම |
|---|---|---|---|---|
| පළමුවන ස්ථානය | 07 | 08 | 09 | 10 |
| දෙවන ස්ථානය | 06 | 07 | 08 | 09 |
| තුන්වන ස්ථානය | 05 | 06 | 07 | 08 |

(උපරිම ලකුණු 10)

සැ.යු. :-

- එක් අවුරුද්දකට පමණක් ලකුණු ලබා දීමට යටත් ව, ආසන්න පසුගිය වසර 03 ක් සලකා බැලීම සුදුසු ය.
- ඉහත 1.2 හි දී, එක් ශිෂ්‍යත්ව අපේක්ෂකයෙකුට එක ම විෂය සමගාමී ක්‍රියාකාරකමක් සඳහා ජාතික, පළාත්, කලාප සහ පාසල් යන මට්ටම් තුනේ ම අනුයාත වසර 03කට අදාළ ව ජයග්‍රහණ පවතී නම් ලකුණු දීමේ දී සැලකිල්ලට ගත යුත්තේ ඉහළ ම ලකුණු මට්ටම පමණි.

3. <u>ශිෂ්‍ය නායකත්වය - සියලු ශ්‍රේණි සඳහා</u>

| | |
|---|---|
| පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායක / උප ප්‍රධාන ශිෂ්‍ය නායක | ලකුණු 15 |
| ශිෂ්‍ය නායක (ජ්‍යෙෂ්ඨ/කනිෂ්ඨ ) | ලකුණු 12 |
| පන්ති නායක | ලකුණු 10 |

(උපරිම ලකුණු 15)

සැ.යු. :- ඉහත 03 හිදි ලකුණු දීමේ දී සැලකිල්ලට ගත යුත්තේ ඉහළ ම මට්ටම් පමණි.

4. <u>ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ/ සීලමාතාව/ ශිෂ්‍යයා/ශිෂ්‍යාව දහම් පාසල් අධ්‍යාපනය හැදෑරිම / දහම් පාසලේ ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු සිදු කිරීම.</u>

**(දහම් පාසල් ප්‍රධානාචාර්ය විසින් නිකුත් කළ සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.)**

| | |
|---|---|
| දහම් පාසල් අධ්‍යාපනය හැදෑරිම.<br>(වසරකට වැඩි කාලයක් දහම් අධ්‍යාපනය ලැබීම සහ මේ වන විටත් දහම් පාසලක ශිෂ්‍ය ශිෂ්‍යාවක ලෙස කටයුතු කිරීම.) | ලකුණු 05 |
| දහම් පාසලේ ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු සිදු කිරීම | ලකුණු 05 |
| (උපරිම ලකුණු 05) | |

- සියලු ලියාපදිංචි ආගමික දහම් පාසල් මේ යටතට අයත් වේ.
-

5. <u>ලකුණු සාරාංශය</u>

- ඉහත 1 සිට 4 දක්වා සියලු කොටස් වලට ලබා ගත් උපරිම ලකුණු ප්‍රමාණයන් ඊට අදාල කොටස තුළ සාරාංශගත කොට ඉදිරිපත් කළ යුතු ය.

**ඔබට තවදුරටත් තොරතුරු දැනගැනීමට අවශ්‍ය නම් පහත සඳහන් විද්‍යුත් ලිපිනයට (Email) පණිවිඩයක් යොමු කිරීම මඟින් හෝ දුරකථන අංක වෙත ඇමතුමක් ලබා දීම මඟින් සිදු කළ හැකි ය.**

**විද්‍යුත් ලිපිනය (Email) :-** pfschol@presidentsoffice.lk

**011 -2 354 354 - දිගු අංක :- 4830/ 4835/ 4837**

**074 - 085 4527 (WhatsApp මඟින් යොමු වන පණිවුඩ පමණි )**

ඇමුණුම 01

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා :-

ආදර්ශ අයදුම්පත්‍රය

**පිරිවෙන් හා සීලමාතා අධ්‍යාපන ආයතනවල ඉගෙනුම ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා, සීලමාතාවන් හා ගිහි ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ජනාධිපති අරමුදල මගින් පිරිනැමෙන ශිෂ්‍යත්ව වැඩසටහන- 2024/ 2025**

(කරුණාකර අයදුම්පත සම්පූර්ණ කිරීමට ප්‍රථම උපදෙස් පත්‍රිකාව බලන්න.)

පළාත :- ............................ දිස්ත්‍රික්කය:- ...................... අධ්‍යාපන කලාපය :- ........................

## I කොටස

### 1. අයදුම්කරුගේ පෞද්ගලික තොරතුරු

1.1. මුලකුරු සමග නම (සිංහල) :- ........................................................................

1.2. මුලකුරුවලින් හැඳින්වෙන නම (සිංහල) :- ........................................................................

1.3. මුලකුරු සමග නම (ඉංග්‍රීසි) :- ........................................................................

1.4. අධ්‍යාපන ලබන පිරිවෙනේ/සීලමාතා ආයතනයේ නම :- ........................................................................

1.5. ඉගෙනුම ලබන ශ්‍රේණිය :- ........................................................................

1.6. උපන් දිනය :- | | | | | | | | | | (YYYY/MM/DD)

1.7. ජාතික හැඳුනුම්පත් අංකය :- | | | | | | | | | | | | |

1.8. ආචාර්ය ස්වාමීන් වහන්සේ /මව /පියා /භාරකරුගේ නම :- ........................................................................

1.9. ආචාර්ය ස්වාමීන් වහන්සේ /මව /පියා /භාරකරුගේ ජාතික හැඳුනුම්පත් අංකය :- | | | | | | | | | | | | |

1.10. දුරකථන අංකය (කෙටි පණිවුඩ යැවිය හැකි) :- | 0 | 7 | | | | | | | | |

1.11. දුරකථන අංකය (සම්බන්ධ කර ගත හැකි) -: | | | | | | | | | | |

1.12. පෞද්ගලික ලිපිනය (සිංහල) :- ........................................................................

........................................................................

1.13. පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි) :- ........................................................................

........................................................................

## II කොටස

**01. ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ/සිලමාතාවන් සහ ගිහි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ කාර්යසාධනය**

**1.1.** කාණ්ඩ අංක 01 - පිරිවෙන් (සාමාන්‍ය පෙළ) තෙක් ඉගෙනුම ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා, සීලමාතාවන් හා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) තෙක් ඉගෙනුම ලබන ගිහි ශිෂ්‍ය ශිෂ්‍යාවන් 2023 වර්ෂයේ පැවති අවසාන වාර පරීක්ෂණයේ දී පන්තියේ ලබා ඇති ස්ථානය (පිරිවෙන් සාමාන්‍ය පෙළ සහ අ.පො.ස සමාන්‍ය පෙළ තෙක් අපේක්ෂකයින් සඳහා පමණි.)

| කාණ්ඩය | ස්ථානය | ලකුණු |
|---|---|---|
| 01 වන ස්ථානය සිට 03 වන ස්ථානය දක්වා | | |
| 04 වන ස්ථානය සිට 06 වන ස්ථානය දක්වා | | |
| 07 වන ස්ථානය සිට 10 වන ස්ථානය දක්වා | | |
| 11 වන ස්ථානය සිට 15 වන ස්ථානය දක්වා | | |
| 16 වන ස්ථානය සිට 20 වන ස්ථානය දක්වා | | |

(උපරිම ලකුණු 70)

**1.2.** <u>පිරිවෙන් (සා.පෙළ) හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ ප්‍රතිපල</u> (අ.පො.ස. උසස් පෙළ) සහ ප්‍රාචින විභාග සඳහා අයදුම් කරන අපේක්ෂකයන් සඳහා පමණි)

| | විෂයය | | ශ්‍රේණිය | ලකුණු |
|---|---|---|---|---|
| 1.2.1. | ත්‍රිපිටක ධර්මය /බුද්ධර්මය | :- | ............... | |
| 1.2.2. | සිංහල/ භාෂාව හා සාහිත්‍ය | :- | ............... | |
| 1.2.3. | පාලි | :- | ............... | |
| 1.2.4. | සංස්කෘත | :- | ............... | |
| 1.2.5. | ගණිතය | :- | ............... | |
| 1.2.6. | ඉතිහාසය | :- | ............... | |
| 1.2.7. | ඉංග්‍රීසි භාෂාව | :- | ............... | |
| 1.2.8. | විද්‍යාව/සාමාන්‍ය විද්‍යාව | :- | ............... | |
| 1.2.9. | පළමු විෂය කාණ්ඩයට අයත් විෂයය (විෂයය..............................................) | :- | ............... | |
| 1.2.10. | දෙවන විෂය කාණ්ඩයට අයත් විෂයය (විෂයය..............................................) | :- | ............... | |
| 1.2.11. | තෙවන විෂය කාණ්ඩයට අයත් විෂයය (විෂයය..............................................) | :- | ............... | |

ලබාගෙන ඇති ලකුණු එකතුව
(උපරිම ලකුණු ප්‍රමාණය 70 කි.)

**02. විෂය සමගාමී ක්‍රියාකාරකම් (ක්‍රීඩා/ සෞන්දර්ය සහ වෙනත්)**

පිරිවෙන්/සීලමාතා අධ්‍යාපන ආයතන / පාසල් මට්ටමින් ක්‍රියාත්මක අන්තර් පාරිවේණික භාෂා හා සාහිත්‍ය තරග/ මලලක්‍රීඩා/ චෙස්/ පිහිනුම්/ ජිම්නාස්ටික්/ කරාතේ/ පරිසර ළමා සමාජ/ වාදනය/ගායනය/චිත්‍ර/නැටුම්/ පෝතක බාලදක්ෂ/ කුඩා මිතුරි සහ වෙනත් අනුමත විෂය සමගාමී ක්‍රියාකාරකම් (ගිහි හෝ පැවිදි සඳහා අදාළ වන පරිදි)

| විෂයය සමගාමී ක්‍රියාකාරකම් | පිරිවෙන්/ සීලමාතා ආයතන මට්ටමින් | | | කලාප මට්ටමින් | | | දිස්ත්‍රික්/ පළාත් මට්ටමින් | | | ජාතික මට්ටමින් | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නායකත්වය/ සහභාගීත්වය | | | නායකත්වය/ සහභාගීත්වය | | | නායකත්වය/ සහභාගීත්වය | | | නායකත්වය/ සහභාගීත්වය | | |
| | 1 වන ස්ථානය | 2 වන ස්ථානය | 3 වන ස්ථානය | 1 වන ස්ථානය | 2 වන ස්ථානය | 3 වන ස්ථානය | 1 වන ස්ථානය | 2 වන ස්ථානය | 3 වන ස්ථානය | 1 වන ස්ථානය | 2 වන ස්ථානය | 3 වන ස්ථානය |
| 1. | | | | | | | | | | | | |
| 2. | | | | | | | | | | | | |
| 3. | | | | | | | | | | | | |
| 4. | | | | | | | | | | | | |

ලබාගෙන ඇති ලකුණු එකතුව
(උපරිම ලකුණු ප්‍රමාණය 10 කි.)

**03. ශිෂ්‍ය නායකත්වය**

| | | ලකුණු |
|---|---|---|
| 01 | පිරිවෙන්/සීලමාතා අධ්‍යාපන ආයතන ප්‍රධාන ශිෂ්‍ය නායක / උප ප්‍රධාන ශිෂ්‍ය නායක | |
| 02 | ශිෂ්‍ය නායක (කනිෂ්ඨ/ජ්‍යෙෂ්ඨ) | |
| 03 | පන්ති නායක | |
| | ලබාගෙන ඇති ලකුණු එකතුව (උපරිම ලකුණු ප්‍රමාණය 15 කි.) | |

**04. අයදුම්කරු දහම් පාසල් අධ්‍යාපනය හැදෑරීම (සියලු ශ්‍රේණි සඳහා)**

| | ලකුණු |
|---|---|
| දහම් පාසල් අධ්‍යාපනය හැදෑරීම<br>(වසරකට වැඩි කාලයක් දහම් අධ්‍යාපනය ලැබීම සහ මේ වන විටත් දහම් පාසලක ශිෂ්‍යයකු/ ශිෂ්‍යාවක ලෙස කටයුතු කිරීම.) | |

(උපරිම ලකුණු (05)

**05.** ලකුණු සාරාංශය

| | | |
|---|---|---|
| 01 | 2023 වර්ෂයේ පැවති අවසාන වාර පරීක්ෂණයේ දී පන්තියේ ලබා ඇති ස්ථානය හෝ පිරිවෙන් (සා.පෙළ) හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල | |
| 02 | විෂය සමගාමී ක්‍රියාකාරකම් (ක්‍රීඩා/ සෞන්දර්ය සහ වෙනත්) | |
| 03 | ශිෂ්‍ය නායකත්වය | |
| 04 | දහම් පාසල් අධ්‍යාපනය හැදෑරීම (සියලු ශ්‍රේණි සඳහා) | |

| | |
|---|---|
| ලබාගෙන ඇති මුළු ලකුණු ප්‍රමාණය | |

ඉහත දැක්වෙන කරුණු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. අවශ්‍ය අවස්ථාවකදී අදාළ සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට මම එකඟ වෙමි.

……………………..
දිනය : 2024…………… අයදුම්කරුගේ අත්සන

---

<u>පවුලේ මාසික ආදායම පිළිබඳ ප්‍රකාශය</u>**(ගිහි ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා පමණි.)**

**(මව/පියා/භාරකරු විසින් සම්පූර්ණ කළ යුතුය.)**

මම ……………………………………………………………………………………… රැකියාව කරමි./ රැකියාවක් නොකරමි.
(රැකියාව කුමක්ද යන්න)
මගේ ස්වාමිපුරුෂයා/භාර්යාව…………………………………………………………………… ආයතනයේ රැකියාව කරනු ලබයි. / රැකියාවක් කරනු නොලබයි. අප පවුලේ මාසික ආදායම රු: ……………………………. (ඉලක්කමෙන්) ……………………………………………………………………………… (අකුරින්) බව ද ප්‍රකාශ කරමි.

………………………………………
මව/පියා/භාරකරුගේ අත්සන

දිනය : 2024…………….

නම : ……………………………………………………

---

ඉහත සඳහන් ආදායම පිළිබඳ කරුණු නිවැරදි බව සහතික කරමි.

……………………………………
ග්‍රාම නිලධාරීගේ අත්සන
(නිල මුද්‍රාව)

දිනය : 2024………………

ඉහත ආදායම පිළිබඳ කරුණු නිවැරදි බව සහතික කරමි.

.......................................
ප්‍රාදේශීය ලේකම්
(නිල මුද්‍රාව)

දිනය : 2024...............

---

**පරිවේණාධිපති / ආයතනාධිපති,**

................................................ ශිෂ්‍යයා/ ශිෂ්‍යාව විසින් සඳහන් කර ඇති කරුණු නිවැරදි බවත්, ඉදිරිපත් කර ඇති නිර්ණායක හා ලකුණු පටිපාටිය අනුව ලබාගෙන ඇති ලකුණු නිවැරදි බවත්, අදාල ලේඛන/ සහතික පෞද්ගලිකව පරීක්ෂා කළ බවත් සඳහන් කරමි. ඒ අනුව, මෙම ශිෂ්‍යත්ව අයදුම්පත්‍රය සම්බන්ධයෙන් පහත නිර්දේශයන් ඉදිරිපත් කරමි.

පිරිවෙන් තේරීම් කමිටුවේ සාමාජිකයන්ගේ විස්තර හා නිර්දේශ:-

| | නම | තනතුර | අත්සන/දිනය | නිර්දේශ කරමි/නොකරමි |
|---|---|---|---|---|
| 1. | ............................................. | ................................ | ............................... | ................................... |
| 2. | ............................................. | ................................ | ............................... | ................................... |
| 3. | ............................................. | ................................ | ............................... | ................................... |

දිනය : 2024............... පන්ති භාර ගුරුතුමාගේ/ ගුරුතුමියගේ නම හා අත්සන : ..................................

---

**කලාප භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ,**

ඉහත 1 – 5 දක්වා සඳහන් කර ඇති ලකුණු පිරිවෙන් තේරීම් කමිටුව මගින් පරීක්ෂා කළ බවත්, අනෙකුත් පෞද්ගලික තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි. එබැවින් (තෝරා ගන්නා ලද අපේක්ෂකයන්ගේ අයදුම්පත් පමණි.)........................................... ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ /සීලමාතාව/ශිෂ්‍යයා/ ශිෂ්‍යාව විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

එසේම ශිෂ්‍යත්වලාභියාගේ මව/පියා/භාරකරුගේ හවුල්කාරීත්වයෙන් යුතුව පවතින මාසිකව ශිෂ්‍යාධාර ලබාගත හැකි (විශේෂ බද්ධ ගිණුමක්) ඉතිරිකිරීමේ ගිණුමේ විස්තර ඇතුළත් පිටුවේ (තොරතුරු පිටුව) ඡායා පිටපතක් සහ මව/පියා/භාරකරුගේ ජාතික හැඳුනුම්පතෙහි පරිවේණාධිපති / ආයතනාධිපති විසින් සහතික කරන ලද ඡායා පිටපතක් කලාප භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) වෙත ඉදිරිපත් කළ යුතු ය.

---------------- ------------------------------------------
දිනය පරිවේණාධිපති හිමිගේ අත්සන හා නිල මුද්‍රාව

---

**අධ්‍යක්ෂ පිරිවෙන් මගින්**
**ලේකම්**
**අධ්‍යාපන අමාත්‍යාංශය**

ශිෂ්‍යත්වලාභියා වන .................................................. විසින් ඉදිරිපත් කර ඇති ඉහත විස්තර සඳහන් අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි.

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නම : ...................................

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන : ...................................

දිනය : 2024............... (නිල මුද්‍රාව)

ආකෘති 1

**අධ්‍යාපන කටයුතු සඳහා පිරිවෙන් හා සීලමාතා අධ්‍යාපන ආයතන 02 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය ප්‍රවීන පණ්ඩිත විභාගය දක්වා ඉගෙනුම ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා/සීලමාතාවන්/ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ජනාධිපති අරමුදල මගින් පිරිනැමෙන ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන - 2024/2025**

(එක් එක් පිරිවෙනේ/සීලමාතා අධ්‍යාපන ආයතනයේ තේරීපත්වන ශිෂ්‍යත්වලාභින්ගේ ලකුණු අනුපිළිවෙල මත එක් ස්ථානයකට ඇතුළත් වන සේ මෙම ආකෘතිය සම්පූර්ණ කළ යුතුය.)

පළාත :- දිස්ත්‍රික්කය :- අධ්‍යාපන කලාපය :-

| අධ්‍යාපනය ලබන පිරිවෙනේ/සීලමාතා අධ්‍යාපන ආයතනයේ නම | අනුක්‍රමික අංකය | ශිෂ්‍යත්වලාභියාගේ නම | ස්ත්‍රී/ පුරුෂ භාවය | පෞද්ගලික ලිපිනය | ලබාගත් ලකුණු |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |

කලාපයේ තේරීම් කමිටුව තනතුර රාජකාරී ලිපිනය අත්සන සාමාජිකයාගේ නම

1.

2.

3.

දිනය :-

ඉහත තෝරාගත් සිසු නාම ලේඛනය නිර්දේශ කරමි.

දිනය :- .................................. නම, අත්සන හා නිලමුද්‍රාව :- .........................................
(කලාප භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - පිරිවෙන්)

ඉහත කලාප භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) විසින් නිර්දේශ කර ඉදිරිපත් කර ඇති තෝරාගත් සිසු නාම ලේඛණය නිර්දේශ කරමි.

දිනය :- .................................. නම, අත්සන හා නිලමුද්‍රාව :- .........................................
(පළාත් භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ - පිරිවෙන්)

**ඇකෘති 01 සම්පූර්ණ කිරීමේදී පහත සඳහන් උපදෙස් පිළිබඳව සැලකිලිමත් විය යුතුය. :-**

I. **MS - Excel Sheet** එකක් ආකාරයට තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

II. සෑම පිරිවෙනකින්/සිලමාතා අධ්‍යාපන ආයතනයකින් ම ශිෂ්‍යත්වලාභීන් උපරිම සංඛ්‍යාව ඇමුණුම 01හි සඳහන් ආකාරයට තෝරාගත යුතු අතර, පිරිවෙන්/බෞද්ධ සිලමාතා අධ්‍යාපන වශයෙන් වෙන් වෙන්ව සඳහන් කළ යුතුය.

උදා :-

| අධ්‍යාපනය ලබන පිරිවෙනේ/සිලමාතා අධ්‍යාපන ආයතනයේ නම | අනුක්‍රමික අංකය | ශිෂ්‍යත්වලාභියාගේ නම | ස්ත්‍රී/ පුරුෂ භාවය | පෞද්ගලික ලිපිනය | ලබාගත් ලකුණු |
|---|---|---|---|---|---|
| විද්‍යෝදය පිරිවෙණ | 01 | **පූජ්‍ය නාරද හිමි** | | | |
| | 02 | **පූජ්‍ය සීවලි හිමි** | | | |
| **(උපරිම ශිෂ්‍යත්වලාභීන් ගණන ඇමුණුම 01හි සඳහන් ආකාරයට)** | 03 | **බී සී ඒ විරසිංහ** | | | |
| | .<br>.<br>. | | | | |
| නාලන්දා පිරිවෙන් විද්‍යායතනය | 01 | **ඒ බී සී රත්නායක** | | | |
| | 02 | **බී ඒ සී කුමාරි** | | | |
| | .<br>. | | | | |

III. ශිෂ්‍යත්වලාභීන්ගේ නම් සඳහන් කර එවන තීරුව මුලකුරු සහිතව සඳහන් කළ යුතු අතර මුලකුරු අතර තිතක් නොතබා එක් හිස්තැනක් (Space 1ක්) පමණක් තැබිය යුතුය.

**උදා- ඒ බී සී සේනානායක** | √ | **ඒ.බී.සී.සේනානායක** | **x**

IV. ලිපිනය සඳහන් කිරීමේදී ශිෂ්‍යත්වලාභියාගේ නිවැරදි ලිපිනය සඳහන් කිරීම කළ යුතු වේ.

V. කලාපීය තේරීම් කමිටුවේ සමාජිකයින් අත්සන් කරන ලද ලේඛනය නිර්දේශ කිරීම සඳහා පළාත් භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) වෙත යැවීම කළ යුතු අතර, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් එම ලේඛනය නිර්දේශ කර එවීමට කටයුතු කළ යුතුය.

**Forms 02**

## List of names recommended for scholarships program 2024/2025

**Province :-** **District :-** **Educational Zone :-**

Name of the coordinating officer of the ZEO :-
Contact Detail,

Mobile No :- Office Tel. No :-
Whatsapp No :- Email Address : -

| 01 | 02 | 03 | 04 | 05 | 06 | 07 | 08 | 09 | 10 | 10 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| Pirivena/ Seelamatha Education Institution Name | Serial No. | Name of the Student | Name of the Parent/Guardian | Parent's/Guardian's NIC No | Bank & Branch | Branch Code | Joint Account Number | Mobile Num. (SMS ) | Mobile Num. | Address |
| | | | | | | | | | | |

..............................................

Name & Signature (Official Seal)
Assistant Director of Zonal Education (Piriven)

Date :- ...........................

**ආකෘති 02 පිරවීමේදී පහත සඳහන් උපදෙස් පිළිබඳව සැළකිළිමත් විය යුතුය.**

1. ආකෘති පත්‍රය 02 **ඉංග්‍රීසි භාෂාවෙන් පමණක්** පුරවා එවිය යුතුය.

2. **MS - Excel Sheet** එකක් ආකාරයට තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

3. **"Times New Roman"** ආකාරයට **අකුරු ප්‍රමාණය 11** න් ඉහත ආකෘති පත්‍ර 02 සම්පූර්ණ කර එවිය යුතුය.

4. ශිෂ්‍යත්වලාභීන්ගේ සහ මව/පියා/භාරකරුගේ නම් සඳහන් කර එවන තීරුව මුලකුරු සහිතව සඳහන් කළ යුතු අතර, මුලකුරු අතර තිතක් නොතබා එක් හිස්තැනක් (Space 1ක්) පමණක් තැබිය යුතුය.

   උදා- A B C Senanayake | √ |   A.B.C.Senanayake | x |

5. ශිෂ්‍යත්වලාභීන්ගේ දූරකථන අංකය සඳහන් කිරීමේදී සැම විටම පහත පරිදි නිවැරදිව සඳහන් කිරීම කළ යුතුය.

   උදා- 0771111111 - √
   077 1111111 - **x**   077 - 1111111 - **x**

6. සියලු ම ශිෂ්‍යත්වලාභීන් සඳහා ශිෂ්‍යත්ව මුදල් ගෙවීම් කිරීම සඳහා **මහජන බැංකුවේ, ලංකා බැංකුවේ හෝ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ශිෂ්‍යත්වලාභියාගේ සහ මව/පියා/භාරකරුගේ හවුල්කාරිත්වයෙන් යුතුව පවතින (බද්ධ ගිණුමක්) සක්‍රිය බැංකු ගිණුමක** ගිණුම් තොරතුරු ලබාදිය යුතුවේ.

7. එම තොරතුරු සනාථ කරගැනීම සඳහා අදාළ බද්ධ බැංකු ගිණුම් පොතේ තොරතුරු පිටුවේ පැහැදිලි ඡායා පිටපතක් හා මව/පියා/භාරකරුගේ ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් විදුහල්පති විසින් සහතික කර ඉදිරිපත් කළ යුතුය.

දිනය :-

ලේකම්
ජනාධිපති අරමුදල

**අධ්‍යාපන කටයුතු සඳහා පිරිවෙන් හා සීලමාතා අධ්‍යාපන ආයතන වල 02 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණි / ප්‍රාචීන පණ්ඩිත විභාග දක්වා ඉගෙනුම ලබන ශිෂ්‍ය භික්ෂූන් වහනසේලා/සීලමාතාවන් සහ ශිෂ්‍ය/ශිෂ්‍යාවන් වෙනුවෙන් ජනාධිපති අරමුදල මගින් පිරිනැමෙන ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන - 2024/2025**

විධිමත් පරිදි ශිෂ්‍ය කාර්ය දර්ශකය ලබා නව පිරිවෙනකට/සීලමාතා අධ්‍යාපන ආයතනයකට ඇතුළත් වූ ශිෂ්‍යත්වලාභීන් පිළිබඳ දැන්වීම.

ශිෂ්‍යත්වලාභියාගේ නම :- ..........................................................................

ඉගෙනුම ලැබූ පිරිවෙන/සීලමාතා අධ්‍යාපන ආයතනය හා ලිපිනය :- ..........................................................................

පිරිවෙන/සීලමාතා අධ්‍යාපන ආයතනය අයත් කලාපය :- ..........................................................................

ඉගෙනුම ලැබූ ශ්‍රේණිය :- ..........................................................................

ශිෂ්‍යත්ව ප්‍රතිලාභය ලබා ගත් කාල සීමාව :- ..........................................................................

පිරිවෙන/සීලමාතා අධ්‍යාපන ආයතනය/පාසලෙන් අස් වූ දිනය :- ..........................................................................

පිරිවෙන/සීලමාතා අධ්‍යාපන ආයතනය/පාසලෙන් අස්වීමට හේතුව :- ..........................................................................

(ශිෂ්‍ය කාර්ය දර්ශනයේ පිටපතක් අමුණන්න)

ඇතුළත් වූ නව පිරිවෙනේ/සීලමාතා අධ්‍යාපන ආයතනයේ නම හා ලිපිනය :- ..........................................................................

එම පිරිවෙන/සීලමාතා අධ්‍යාපන ආයතනය අයත් කලාපය :- ..........................................................................

ඇතුළත් වූ ශ්‍රේණිය :- ..........................................................................

ඉහත දැක්වෙන කරුණු සත්‍ය හා නිවැරදි බව දන්වා සිටිමි.

දිනය : ........................ ........................ ..........................................................

අයදුම්කරුගේ අත්සන | මව/පියා/භාරකරුගේ නම සහ අත්සන

---

**ලේකම්, ජනාධිපති අරමුදල,**

ඉහත නම සඳහන් ශිෂ්‍යත්වලාභියා වන ........................................ ශිෂ්‍ය/ශිෂ්‍යාව ........................ දින මෙම පිරිවෙනට/සීලමාතා අධ්‍යාපන ආයතනයට ඇතුළත් වූ බවත්, මේ වන විට .......... ශ්‍රේණියේ ඉගෙනුම ලබන බවත් සහතික කරමි.

දිනය : ........................ ..........................................................

පරිවේණාධිපති/ආයතනාධිපතිනි
නම සහ අත්සන
(නිල මුද්‍රාව)